


# "කුඩු කිරිල්ලී" දොරට වඩියි



සිසිර දිසානායක

"මිනිස් සිතේ සංකීර්ණත්වය විග්‍රහ කර අවසන් කරන්නට යම් දවසක හැකි වුවහොත් එදට සාහිත්‍ය නිර්මාණය ද අවසන් වනු ඇතැයි මට සිතෙන්නේ මිනිස් සිත හැදෑරීමට කෙටි කතාව තරම් උචිත මාධ්‍යයක් නැති බව භාවිතයෙන් පසක් කර ගත් බැවිනි. මේ කෙටි කතා සංග්‍රහය තුළ ද එවැනි උත්සාහයක් දක්නට තිබේ."

ප්‍රවීණ ලේඛක ජයතිලක කම්මැල්ලවීරයන් එලෙසින් සටහන් තබන්නේ ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකේය ලේඛකයින් විසින් රචිත "කූඩු කිරිල්ලී" නූතන කෙටි කතා සරණිය වෙනුවෙන්.

"කෙටි කතා නිර්මාණය යනු ඊතලයකින් ඉලක්කයකට විදීම වැනි යැයි ඇලන්ඩේ කීවේ ඇයට නව කතාවක් ලයනවාට වඩා කෙටි කතාවක් ලිවීම අමාරු බව ද කියමිනි. ඒ අතර ආරියවංශ රණවීර කවියා මෙසේ ලීවේ ය. "කෙටි කතාවත්, කවියත් නිවුන් සොහොයුරන් වැන්න. කළුවර රාත්‍රියක කෙටූ විදුලියක් මෙන් නිමේෂයකින් මහා ප්‍රදේශයක් හෙළි පෙහෙළි කරන්නාක් මෙන් කෙටි කථාව, තොරාගත් සිද්ධි සමූහයක් සහ අර්ථපූර්ණ බස් වහරක් තුළින් ජීවන ප්‍රදේශයක් එළි පෙහෙළි කළ යුතු ය." ඒ කම්මැල්ලවීරයන්ගේ පෙරවදනින් උපුටා ගත් තවත් කොටසකි.

"නිර්මාණකරුවකු තුළ පවතින ජීවිත කුතුහලය අපරිමාණය. එබැවින් සිය බුද්ධි ප්‍රදීපය දල්වා සමාජ දේහයේ හැඩතල නිරීක්ෂණය කරයි. පරිකල්පනය නැමැති අතැ'ඟිලි විහිදුවමින් එහි සියොළඟ ස්පර්ශ කරයි. එහි මටසිලිට්කම් සේම රළු පරළුකම් ද ඉසියුම් වාචික චිත්‍රයක් බවට පත්කරන තුරු නිර්මාණකරුට ඉහිලුම් නැත.

මෙල්බන් නුවර වාසය කළ පසුගිය වසර කීපය තුළදී මෙහි ජීවත්වන්නා වූ සහෘදයන්ගේ අනේකවිධ නිර්මාණාත්මක හැකියාවන් සහ විශේෂයෙන් ම සාහිත්‍ය ප්‍රබෝධය මගින් මා විස්මයට පත්කරනු ලැබීය..."

ඒ "කූඩු කිරිල්ලිය" සංස්කරණය කරමින් කෙටි කතා 14 ක් ගොණු කළ රාජ්‍ය සම්මාන ලාභී ස්වර්ණකාන්ති රාජපක්ෂ ලේඛිකාවගේ ස්තූති සටහනින් ගත් උදෘතයක්.

බහු සංස්කෘතික වටපිටාවක් නිර්මාණය වෙමින් පවතින ඕස්ට්‍රේලියාවේ විප්‍රවාසී අප ජන පිරිස වෙතින් නිර්මාණය වූ කෙටිකතා පෙළක් ගොනු කිරීමේ ගෞරවය හිමි වන්නේ ස්වර්ණකාන්ති රාජපක්ෂ නම් වූ ගුරුවරියටයි. තමන් ප්‍රගුණ කළ දේ වෙනුවෙන් ඒ සඳහා උනන්දු වන පිරිසක් ආශක්ත කරවාගන්නී, අපගේ උප සමාජ කුලකය වෙත කළ හැකි වන යුතුකමත් මැනවින් ඉටු කරලන්නී ය.

"කූඩු කිරිල්ලිය" සමඟ කුඩුවන පිරිසට කතා අනුපිළිවෙලින්, ලක්ෂ්මන් කොඩිතුවක්කු, දිලිනි ඊරියවල, ජගත් ජේ. එදිරිසිංහ, ශ්‍රීනාත් මද්දුමගේ, සිසිර දිසානායක, විනීතා විජේරත්න, දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය, නොයෙල් නඩේසන්, සමන් කුලරත්න, ඩබ්. එච්. උපසේන, ස්වර්ණකාන්ති රාජපක්ෂ, ප්‍රභා කුමාරි ලියනාරච්චි, උපේක්ෂා සේනානායක සහ විද්‍යානි මානතුංග එක්වෙති. ඔවුන්ගේ කෙටිකතා වන්නේ පිළිවෙළින්, "කන්ද පාමුල සරෝජිනී", " සදතනික රාත්‍රියක්", "ගන්ධබ්බ", "සදුර්ග මගියෝ", "සුරු හුරුව", "තෑග්ග", "කූඩු කිරිල්ලී", "දෙහදක කතාවක්", "කිරි අම්මා", "සිරිදස බාප්පා", "රතු එළිය", "මල් වැස්ස", "මයිලස් ශිබා කථා වස්තුව", සහ "මගේ මහමෙර" යන එකතුවයි. "Secrets" නමින් ඉංග්‍රීසි බසින් නොයෙල් නඩේසන් ලියූ කෙටි කථාව ස්වර්ණකාන්ති රාජපක්ෂ සිංහලයට පරිවර්තනය කරන්නේ "දෙහදක කථාවක්" ලෙසිනි.

ඉහත මාතෘකාවලින් ම පෙනී යන එක් කරුණක් වන්නේ විවධ විෂයයන් අලලා මේ කෙටි කතා ලියැවී ඇති බවයි. පොත පවා පළකර ඇති ලේඛකයින් කීප දෙනෙක් ද, ප්‍රජා පුවත්පත් සඳහා ලිපි සම්පාදනය කරනා කීප දෙනෙක් ද, වෙනත් මාධ්‍ය සහ කලාවන්ට යොමු වූ කීප දෙනෙක් ද ඇතුලත්වන ඉහත කෙටි කතා රචක ලේඛණයෙන් ම විවිධත්වය තවත් ආකාරයකින් දෘෂ්‍යමාන වේ. ඔවුන් අතරින් ඇතැමෙකු මේ පළමුවරට කථාවක් ගෙතූ අවස්ථාවයි. විවිධ විෂයයන් අලලා විවිධ වටපිටාවන් ඇති ලියන්නන් ගොනු කළ "කූඩු කිරිල්ලිය" ඒ නිසාම විචිත්‍රවත් වෙයි. තම තමන්ගේ කතාවලට උචිත රචනා ශෛලියන් අනුග මනය කරමින්, තමන්ගේ හෝ අනුන්ගේ අත්දැකීම් හෝ පරිකාල්පනික කතාවන් මේ කෙටි කතා නිර්මාණය වී ඇති බව පෙනෙයි. ඇතැම් කතාවල මේ සියල්ල අඩු  වැඩි ලෙසින් මුසුවී ඇති සේය. පොදු කාරණයක් වන්නේ කතා දෙකක හෝ තුනක හැර අන් සියල්ලට සිය සංක්‍රමණික අත්දැකීම් හෝ පරිසර මුසු කරවීමට ගෙන ඇති උත්සාහයයි. ඇතැම්විට ඒ නිරායාසයෙන් සිදුවන්නක් විය හැකියි. කාන්තා හා පුරුෂ දෙපක්ෂයේ ම සහභාගීත්වය සමසේ ලබා ගැනීමට සංස්කාරකවරිය සමත් වී ඇත්තේ නොදැනිම දැයි නොදනිමු.

"කූඩු කිරිල්ලී" කංචුකය සිතුවමින් සරසන්නේ අප අතර සිටිනා විජය කරුණාසේන චිත්‍ර ශිල්පියාණන්. මෙය "ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනයේ ප්‍රකාශනයකි. ග්‍රන්ථයේ පිදුම වෙනුවෙන් සංස්කාරකවරිය සටහන් තබන්නේ මෙලෙසින්....

"ඕස්ට්‍රේලියාවේ භූමිය තුළ වවිධ සිංහල නිර්මාණ සිදු කරමින් විදේශයක සිට සිංහල සාහිත්‍ය අරුත්බර කිරීමට වෙර දරන සැමට සෙනෙහසින්..."

එලෙස වෙර දරන්නන්ගේ උත්සාහය වන්නේ සිංහල රසික පාඨක පිරිසගේ නැණ නුවන, රසවන්දනය අවුලුවාලීමටයි. එනයින් එකී රසික පාඨකයින් වෙනුවෙන් "කූඩු කිරිල්ලී" මුද්‍රා හරින්නේ ඔක්තෝබර් 13 ද සවස 2.00 ට මවුන්ට් වේවර්ලි ප්‍රදේශයේ ස්ටීවන්සන් පාරේ (Stephenson Roa) අංක 236 දරණ ස්ථානයේ ඇති හෝලි ෆැමිලි පෙරිෂ් හෝල් (Holy Family Perish Hall) හී දීය.

"කූඩු කිරිල්ලී" වෙනුවෙන් දායක වූ මේ පිරිස සියලු රසික ප්‍රේක්ෂක, නෑ හිත මිතුරු පිරිස්වලට තමන් හා මේ අවස්ථාවට එක්වන සේ ළෙන්ගතු සිතින් ආරාධනය කරති.

